**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 200 මට්ටම - 2023**

**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி-புதிய பாடத்திட்டம்) 200 வது தேர்ச்சி மட்டம் - 2023**

**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level – Dec 2023**

**( ECNE 201: Microeconomic Theory)**

කාලය පැය(03) තුනයි
மூன்று (03) மணித்தியாலங்கள்
Time three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න 05 පිළිතුරු සපයන්න
05 வினாக்களுக்கு மட்டும் விடையளிக்க
Answer 05 questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 07 කි
இந்த வினாப்பத்திரத்தில் 07 வினாக்கள் உள்ளன
There are 07 questions in the question paper.

---

1. i. ක්‍රම සූචක උපයෝගිතාව සහ සංඛ්‍යා සූචක උපයෝගිතාව අතර මූලික වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 07)
   ii. ආන්තික උපයෝගිතාව (marginal utility) යන්නෙහි හරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)
   iii. ආන්තික උපයෝගිතාව සහ මුළු උපයෝගිතාව අතර සම්බන්ධතාව කුමක්ද? ප්‍රස්ථාරයක් ඇසුරින් දක්වන්න. (ලකුණු 08)

2. i. හීනවන ආන්තික උපයෝගිතා නියමය සහ ඉල්ලුම් නීතිය අතර සම්බන්ධය සාකච්ඡා කරන්න. (ලකුණු 07)
   ii. ඉල්ලුම් නීතිය පැහැදිලි කොට ඉල්ලුම් වක්‍රය කෙරෙහි එහි සම්බන්ධය පහදන්න. (ලකුණු 05)
   iii. 'උපයෝගිතා-උපරිමකරන පාරිභෝජක වරණය' යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

3. මාසික ආදායම රු. 36.00 ක් ලබන පාරිභෝගිකයෙකුට X සහ Y භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍යව ඇත. ඒවායෙහි මුළු උපයෝගිතා ශ්‍රිත පහත සමීකරණ මගින් දී ඇත.

$$TU_x = 50Q_x - 5Q_x^2$$

$$TU_y = 32Q_y - 4Q_y^2$$

X ඒකකයක මිල රු. 5/- ක්ද, Y ඒකකයක මිල රු. 8/- ක්ද වේ යැයි සිතන්න.

   i. පාරිභෝගිකයාගේ සමතුලිත මිලදී ගැනීම් ප්‍රමාණයන් ගණනය කරන්න. (ලකුණු 05)
   ii. මෙම සමතුලිතතාවයෙහි අදහස ඔබ පැහැදිලි කරන්නේ කෙසේද? (ලකුණු 05)
   iii. සමතුලිතතාවයේදී මුදල් ඒකකයක ආන්තික උපයෝගිතාවය ගණනය කරන්න. (ලකුණු 05)
   iv. අනෙකුත් දේ ස්ථාවරව තිබියදී X භාණ්ඩයෙහි මිල රු. 2/- කින් වැඩිවීයැයි සිතන්න. එවිට ඔහුගේ නව සමතුලිත මිලදී ගැනීම් කුමක් විය යුතුද? (ලකුණු 05)

4. i. "නිෂ්පාදන ශ්‍රිතය" "production function" යන්නෙහි හරය ඔබ විස්තර කරන්නේ කෙසේද? (ලකුණු 05)
   ii. නිෂ්පාදන ශ්‍රිතයක පහත දැක්වෙන විචල්‍යයන් ප්‍රස්ථාරිකව පෙන්නුම් කරන්න. (ලකුණු 05)

      a. මුළු නිෂ්පාදිතය (TP)
      b. සාමාන්‍ය නිෂ්පාදිතය (AP)
      c. ආන්තික නිෂ්පාදිතය (MP)

   iii. සම නිෂ්පාදන වක්‍රවල ගුණාංග/ලක්ෂණ මොනවාද? (ලකුණු 05)
   iv. ආන්තික ශිල්පීය ආදේශන අනුපාතිකය (MRTS) යනු කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 05)

5\. i. ආයතනයක සමතුලිතතාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? පූර්ණ තරඟකාරී සහ ඒකාධිකාරී තත්වයන් යටතේ ආයතනයනවල කෙටිකාලීන සහ දිගුකාලීන සමතුලිතතාව සඳහා වන කොන්දේසි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. "ඒකාධිකාරය සම්පත් අනිසි ලෙස බෙදාහැරීමකට හේතුවන අතර ඒ මගින් සමාජ ශුභ සාධනය පහල යාමකට හේතුවේ." මෙම ප්‍රකාශය පිළිබඳ විවේචනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 10)

6\. i. විචල්‍ය අනුපාත න්‍යාය ප්‍රස්ථාරිකව පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. පහත දැක්වෙන සමීකරණය මගින් බැටරි නිෂ්පාදනයක මුළු පිරිවැය ශ්‍රිතය පෙන්නුම් කෙරේ.

$$TC = 250 + 5Q + 0.05Q^2$$

Q මගින් නිෂ්පාදන ඒකක ගණන දැක්වේ.

a. ඉහත පිරිවැය ශ්‍රිතය හා සම්බන්ධව TFC, TVC, MC සහ AVC ශ්‍රිතයන් ලබා ගන්න. (ලකුණු 10)

b. මෙම නිෂ්පාදකයා පූර්ණ තරඟකාරී ආයතනයක් බව උපකල්පනය කරන්න. නිෂ්පාදන ඒකකයක මිල රු. 10/= නම් ලාභ උපරිමකරන නිෂ්පාදන මට්ටම සොයන්න. (ලකුණු 06)

7\. පහත දැක්වෙන මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

a. සාමාන්‍ය භාණ්ඩයක මිල වෙනස්වීමක ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාකය
b. රජය විසින් පනවනු ලබන උපරිම මිල සහ අවම මිලයන්හි අරමුණු
c. පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය
d. කොබ් ඩග්ලස් (Cobb-Douglas) නිෂ්පාදන ශ්‍රිතය

(කොටසකට ලකුණු 05 බැගින්)

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි)

(சகல வினாக்களுக்கும் 20 புள்ளிகள் வீதம்)